**ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්ම - 2022**

---

ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්මේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය අතර 2020 සැප්තැම්බර් 08 දින එළඹි අංක 6371 එල්කේ,6228 එල්කේ,8878 එල්කේ සහ 6346 එල්කේ දරන මූල්‍ය ගිවිසුම්වල විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ණය ගිවිසුමට අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහත සඳහන් ව්‍යාපෘතිවල හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකය සක්‍රීය කිරීම සහ සෞඛ්‍යය, සමාජ ආරක්ෂණ, කෘෂිකර්ම, අධ්‍යාපන සහ ප්‍රවාහන ක්ෂේත්‍ර අවරණය වන පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් භාවිතයෙන් දුරස්ථව රාජ්‍ය සේවා සැපයීම වැනි කෙටි හා මධ්‍ය කාලීන මැදිහත්වීම් සහිතව කොවිඩ් - 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාර සහ ප්‍රතිසාධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා එක් හදිසි ක්‍රියාකාරී සැලැස්මක් උපයෝගී කර ගනිමින් කාර්යක්ෂම හා සම්බන්ධීකරණයෙන් යුත් ප්‍රතිචාර දැක්වීමක් සහතික කිරීම පිණිස ඒකාබද්ධ සම මූල්‍ය පදනම මත හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ එක් සංචිත ගිණුමක අරමුදල් රැස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,491 කට සමාන එජඩො මිලියන 56 ක් වන අතර එම මුදල අන්තර්ජාතික සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2020 ජුනි 17 වන දින ආරම්භ කරන ලද අතර 2023 මාර්තු 31 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහ වූ අරමුදල් උපයෝජනය කිරීමේ ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවධානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල මූල්‍ය කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

**(අ)**

**විගණන නිරීක්ෂණය**

ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය ප්‍රමුඛතාවය ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් සමස්ථ ප්‍රතිපාදන වලින් සියයට 85 ක් එනම් රු.මිලියන 3,640 ක මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා ලබා දී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ප්‍රතිපාදනය කර තිබූ මුදල රු.මිලියන 264 කි. එය සමස්ථ ප්‍රතිපාදන වලින් සියයට 6 ක් බව නිරීක්ෂණය විය.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

කෘෂිකර්මය සඳහා වන වියදම පහත පරිදි වේ.

| | | 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන | මුළු මුදල රු.මිලියන |
|---|---|---|---|---|
| 1 | බීජ සහ රෝපණ ද්‍රව්‍ය සැපයීම | 2,101 | 0 | 2,101 |
| 2 | ගබඩා පහසුකම් සැපයීම | 116 | 264 | 380 |
| | මුළු මුදල | 2,217 | 264 | 2,481 |

රට තුළපවතින අර්ථික අර්බුදය හේතුවෙන්, මන්දපෝෂණයට එරෙහිව සටන් කිරීමට සහ පාසල් පැමිණීම සහ අධ්‍යාපන කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා රට පුරා සීමිත අවධානමට ලක් විය හැකි දරුවන්ට පෝෂණීය සමබල ආහාර වේලක් ලබා දීම සහතික කිරීම ඉතා වැදගත් විය. ඇමෙරිකානු ඩොලර් මිලියන 19.08 ක මුදලක් යොදා ගනිමින් දිවයින පුරා අවශ්‍යතා ඇති පාසල් 7,926 ක ළමුන් 1,081,927 ක් සඳහා දිවා ආහාර ලාබදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමට CERC ව්‍යාපෘතියේ සංචිතය තීරණය කරන ලදි.

**විගණකගේ නිර්දේශය**

අපේක්ෂිත පරිදි සියළු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අවශ්‍ය වේ.

**(ආ)**

**විගණන නිරීක්ෂණය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රගතිය අනුව විදේශ මූල්‍ය ආශ්‍රිත පිරිවැය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද රුපියල් මිලියන 4,283 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රුපියල් මිලියන 4,009 ක් හා රුපියල් මිලියන 1.2 ක ප්‍රතිපාදන පමණක් භාවිතා කර ඇත.

**කළමනාකරණයේ අදහස් දැක්වීම**

පසුගිය වසරේ ආර්ථික අර්බුදය සහ රටේ පැවති අස්ථාවරත්වය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අභියෝගයක් නිර්මාණය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 30 වන දින වන විට CERC සංචිතය යටතේ සැලසුම් කර ඇති අතර සමහර ක්‍රියාකාරකම් සම්පූර්ණ නොවීමේ අවධානමක් පැවතුනි.

**විගණකගේ නිර්දේශය**

ව්‍යාපෘති අරමුදල් උපරිම ලෙස භාවිතා කර ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්මය,අධ්‍යාපනය, ප්‍රවාහනය, ආපදා කළමනාකරණය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් භාවිතයෙන් දුරස්ථ රාජ්‍ය සේවා සැපයීම ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය ලෙස හඳුනාගෙන ඇතත්, ශේෂ පත්‍රයට අනුව එකතුව රුපියල් මිලියන 708 ක් ඉහත දක්වා ඇති ප්‍රමුඛතාවයන් සඳහා යොදවාගෙන නොතිබුණි. | පසුගිය වසරේ ආර්ථික අර්බුදය සහ රටේ පැවති අස්ථාවරත්වය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අභියෝගයක් නිර්මාණය කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 30 වන දින වන විට CERC සංචිතය යටතේ සැලසුම් කර ඇති අතර සමහර ක්රියාකාරකම් සම්පූර්ණ නොවීමේ අවධානමක් පැවතුනි. | ව්‍යාපෘති අරමුදල් උපරිම ලෙස භාවිතා කර ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.2 ක්‍රියාකාරකම් වල භෞතික කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ඉලක්ක සහ භෞතික ප්‍රගතිය පහත පරිදි වේ. | CERC ව්‍යාපෘතියේ සැලසුම්ගත ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ප්‍රධාන වශයෙන් මිල ඉහල යාමට තුඩු දෙන උග්‍ර ආර්ථික හා මූල්‍ය අර්බුදයේ බාධාව නිසා ඉතා මන්දගාමී විය. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්මය (ගබඩා ඉදිකිරීම), අධ්‍යාපනය (ජලය/සනීපාරක්ෂක පහසුකම් සැපයීම) සහ ප්‍රවාහනය (සනීපාරක්ෂක පහසුකම් ඉදිකිරීම) සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රමාද වූ අතර 2022 දෙසැම්බර් 31 වන විට අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාත්මක කරන ආයතන අසමත් විය. | ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගත යුතුය. |

| | ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය | භෞතික ප්‍රගතිය (2022 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|
| 1 | ක්ෂේත්‍ර භෝග සහ බීජ අර්තාපල් සඳහා ගබඩා 102 ක් ඉදි කිරීම | ව්‍යාපෘති 32 ක් අවලංගු කරන ලද අතර ව්‍යාපෘති 4 ක් අතරමැද නතර කරන ලදි. ව්‍යාපෘති 66 ක් ක්‍රියාත්මක වන අතර ඉන් ගබඩා 36 ක් අවසන් කර ඇත. |
| 2 | පාසල් 486 ක් සඳහා ජලය සැපයීම | පාසල් 313 ක් සම්පූර්ණ කර ඇත. |
| 3 | පාසල් 881 ක් සඳහා සනීපාරක්ෂක සේවා සැපයීම | පාසල් 734 ක සනීපාරක්ෂක පහසුකම් අවසන් කර ඇත. |
| 4 | දුම්රිය ස්ථාන 12 ක් සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (SLTB) ඩිපෝ 21 ක් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | ඩිපෝ වල වැසිකිලි 9 ක ඉදිකිරීම් අවසන් කර ඇත. දුම්රිය ස්ථානවල වැසිකිලි 5 ක ඉදිකිරීම් අවසන් කර ඇත. |